කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2014

මගේ අංකය:DMS/Cir/2014/COLA
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
2014.01.06

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්,

**2014 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා ජීවන වියදම් දීමනාව සංශෝධනය කිරීම**

**01.** 2014 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත ජීවන වියදම් දීමනාව ගෙවීම පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුය.

**02.** ඒ අනුව, පහත සඳහන් (i, ii හා iii) කාණ්ඩයන්ට ඇතුළත් නොවන, සියලුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල හා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 මගින් ආවරණය වන ව්‍යාපෘති කාර්ය මණ්ඩලය මෙම ගෙවීම සඳහා හිමිකම් ලබයි.

i. සාමූහික ගිවිසුම් මගින් හෝ ඒ ආකාරයේ අවබෝධයකින් වැටුප් තීරණය කරනු ලබන ආයතන
ii. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කොට ගත් විචල්‍ය ජීවනාධාර දීමනාවක් මාසිකව ගෙවනු ලබන ආයතන
iii. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මගින් කාර්ය මණ්ඩල හා අදාල වැටුප් තීරණය කරනු නොලබන ආයතන

## 03. ජීවන වියදම් දීමනාව

ඉහත අංක 02 හි පරිදි දැනට එම දීමනාව සඳහා සුදුසුකම් ලබන, හිමිකම් සහිත කාර්ය මණ්ඩලයට දැනට ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව 2014.01.01 දින සිට රු.7800/- ක් විය යුතුය.

## 04. දෛනික වේතන මත සේවය කරන සේවකයින්ට දීමනා

අනියම්/දෛනික වැටුප්ලාභී පදනම මත සේවය කරන සේවකයින්ට 2012.12.10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 48 හි 5.1 ඡේදය යටතේ වන දෛනික ජීවන වියදම් දීමනාව 2014.01.01 දින සිට රු. 260/- ක් වන සේ ගෙවිය යුතුය.

## 05. සාවද්‍ය ගණනය කිරීම්

මෙම චක්‍රලේඛයෙන් පරිබාහිරව කිසියම් තැනැත්තෙකුට මොනයම් හෝ වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් ඒ පිළිබඳ ආයතනයේ මූල්‍ය කළමනාකරු/ ගණකාධිකාරී පෞද්ගලිකව වගකිව යුතු අතර, ගෙවා ඇති මුදල ආපසු ගෙවීමට එම තැනැත්තා බැඳී සිටී. එවැනි සාවද්‍ය වැටුප් පරිවර්තනයන් හෝ ගෙවීම් සිදුකරන වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට අදාල බලධාරීන් ක්‍රියා කළ යුතු වේ.

පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
4. විගණකාධිපති
5. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව